කරදිම අත්‍යවශ්‍ය උත්තේජනයක් වනු ඇත.

වයස අවුරුදු 07-11 දක්වා වූ තෙවන කාණ්ඩය වූ සංයුක්ත ක්‍රියාකාරී චින්තන අවධිය, සංයුක්ත ක්‍රියාකාරකම්වලට හෙළිවන ශාරීරික හා මානසික ශක්තියන් වර්ධනයව වන්නකි. ජීවියකු ලෙස කැපී පෙනීමට හා අභියෝග පිළිගැනීමට ආශාකරණ මේ වයසේදී මීට පෙර තිබූ ලැජ්ජාව හා සබකෝළය පහවී යයි. විවිධ නිර්මාණාත්මක කාර්යයන් කෙරෙහි ලැදියාව වැඩිවේ. ලිංගික මේරීම්වල සංක්‍රාන්ති කාල පරිච්ඡේදනයක් හෙයින් ගවේෂණශීලී ක්ෂේත්‍ර වල යෙදී රසවත් වීමට පෙළඹේ. නැටුම, සංගතීය, නාට්‍යාදිය පමණක් නොව, සාහිත්‍ය රස විඳීමට ආශාකරයි. පාරිසරික පෙළඹවීම් මත නිර්මාණයට ද පෙළඹිය හැකි කාලයකි. කණ්ඩායම් ඇසුර, සමාජානුයෝගය, යහපත් ධනාතමක ආකල්ප වර්ධනය මඟින් පෞරුෂ වර්ධනය වේ. ඊට අවශ්‍ය සම්පත් සැපයීම වැඩි හිටියන්ගේ වගකීම වන්නේය.

විධිමත් චින්තන අවධිය වශයෙන් හඳුන්වන වයස අවුරුදු 11-14 යනු ළමා වයස් කාණ්ඩයේ අවසාන කඩ ඉම ලෙස සැලකේ. මින්පසු එළඹෙන නව යොවුන් අවධිය ළමා ලෝකයෙන් මිදී යන හෙයින් මෙම විධිමත් චින්තන අවධිය පූර්ව නව යොවුන් කාලය ලෙස හැඳින්වේ. ළමයා තුළ විශාල වශයෙන් ශාරීරික හා මානසික වශයෙන් වෙනස්කම් සහිතව තම සිතුම් පැතුම් උත්පාදනය වන වකවානුවකි.

සාමාන්‍ය ලෝකයේ අප දකින වයස අවුරුදු 15 දක්වා වූ ළමයා පිළිබඳ පියාජේ ඉදිරිපත් කළ මනෝවිද්‍යාත්මක විග්‍රහයක් ළමා වයසේ ඇති සංකීර්ණයන් ගැන අභියෝගාත්මක ස්වභාවය අප ඉදිරියේ මතුකර දැක්වයි. සියුම් ඇසින් අප දකින ළමයාට වඩා කුසලතා සපිරුණු ඔවුන්ගේ සත්‍යවුත් අපූර්වවූත් පැතිකඩ අවබෝධ කර ගැනීමට බොහෝ දෙමව්පියන්ට නොව ගුරුවරුන් පවා ඇතැම් විට අසමත් වන හෙයින් ළමයින්ගේ ලෝකය අද වන විට ද බේද ජනක කලුවලාවන්ගෙන් වැසී පතින බව රහසක් නොවේ. වැඩිහිටි සමාජයේ ළමා ලෝකයේ හුදකලාවීම ඊට ප්‍රධාන හේතුව වේ. ඕස්ට්‍රේලියා සංක්‍රාන්ති ළමුන්ද බොහෝ විට මේ තත්ත්වය ඇතිවිය හැකි බව පෙනී යන්නේ වැඩිහිටි ලෝකය තුළ ඔවුන්ගේ ලෝකය අතර අසංස්කෘතික පරතරයක් පවතින බව පෙනී යන හෙයිනි.

ළමා සුසමාහිත පෞරුෂ වර්ධනයකිදී ප්‍රධාන අධ්‍යාපන අරමුණු තුනක් පිළිබඳව ඩී. ඒස්. බ්ලූම් මනෝවිද්‍යාඥයින්ගේ අවධානය යොමුකර ඇත. ඒවා ඔහු ප්‍රජානනය ආවේද හා මනෝචාලක වශයෙන් විග්‍රහ කරන්නේ දැනුම, කුසලතා හා අකාල්ප පදනම්කර ගැනිමිනි. මෙම අවශ්‍යතා ත්‍රිත්වය සම්පූර්ණ කිරීම සඳහා ලොවපුරා විෂය මාලා විවිධ ප්‍රවේශයන් ඔස්සේ ක්‍රියාත්මක කරති. එහිදී ඉහත ලොව පුරා විෂය මාලා විවිධ ප්‍රවේශයන් ඔස්සේ ක්‍රියාත්මක කරති. එහිදී ඉහත සඳහන් වයස් කාණ්ඩ හතරේම ළමයින්ගේ අධ්‍යාපන අරමුණු අතර බුද්ධිය වර්ධනයේදී බලපාන ප්‍රධාන මනෝවිද්‍යා සාදක දෙකක් පිළිබඳ අවධානය යොමු වී ඇත. ඒවා නම් ආරය හා පරිසයයි. ආරය යනු පාරම්පරික ලේ උරුමය හා ජාන ශක්තියයි. මව්පිය පරම්පරා ජාන ලක්ෂණ බලපෑමෙන් බුද්ධිය වර්ධනය වේ. කුසලතා මනා ආකල්පවලටද එය බලපෑ හැකිය. උදාහරණයක් ලෙස සංගීතඥයකුගේ දරුවකුටද සංගීතය පිහිටීම දැක්විය හැකිය. ආර සාධකයට වඩා ළමයකුගේ පෞරුෂයට බලපාන සාධකය පරිසරයයි. ළමයා හැදෙන වැඩනෙ පරිසරය ළමයාගේ සකල හැඩ ගැස්මට ප්‍රධාන වේ. ත්‍රස්තවාදයට ළමයින් භාරකරන්නේ ඔවුන් තුළ ත්‍රස්ත පරිසරයක් ජනිත කිරීමෙනි. සංක්‍රමණික ළමයි කෙරෙහි බලපාන අභියෝගාත්මක සාධකය ඔවුන්ට නුහුරු මහාද්විපික පරිසරය යි. එය ඉංග්‍රීසි බස මුල් කොටගත් එම සංස්කෘතික ලක්ෂණවලින් ආඪ්‍ය වුවකි. එයින් ඔවුන්ට මඟහැරිය නොහැකිය. වයස අවුරුදු පහ ලැබීමට පෙර ඉගෙන ගන්නා ළමා සුරැකුම් මධ්‍යස්ථානයේ සිට සමස්ථ පාසල් අධ්‍යාපන මාධ්‍යයන් යුරෝපීය පරිසරයට නතුවීමේදී ළමයින්ගෙන් මව්බස තුරන්වී යාම ළමයින්ගේ වරදක් නොවේ. ළමයා වැඩි කාලයක් ඇසුරු කරන පරිසරයේදී එසේ වීමේදී ළමයා නොදැනුවත්වම ඊට අනුගත වෙයි.

මෙවැනි හැඩ ගැසීමක් තුළ දරුවා තුළ අපගේ සංස්කෘතික අනන්‍යතාවය සුරැකිය යුත්තේ කෙසේද? යන්න සිතා බැලිය යුත්තකි. එම අභියෝගය අප කෙසේ හෝ තරමකට හෝ විසඳා ගත යුතුය. හැකි උපරිම ක්‍රම සහ විධි යටතේ ගෙදර පරිසරය අපගේ සංස්කෘතික ලක්ෂණවලින් දරුවාට ප්‍රිය උපදවන ස්ථානයක් බවට පත්කිරීම ඊට ඇති ප්‍රධාන ප්‍රතිකර්ම වන්නේය. එය ගෙදර බස සිංහල පමණක් වීමෙන් පිරිමසා ගතහැකි පිළියමක් නොවන්නේය. ළමයාගේ ප්‍රථම වයස් කාණ්ඩයේ සිටම මව් බසට සාහිත්‍යයට නැඹුරු කරවීම සාර්ථක ප්‍රතිඵල ලැබිය හැකිය. ස්වස්ථා පන්තිවලට සහභාගී කරවීම, දහම්පාසල් යැවීම, සංගීත, නැටුම්, නාට්‍ය, චිත්‍ර ආදී අපගේ කලාවන්ට හුරුකරවීම විවිධ සිංහල සාද හා උත්සව වලට සහභාගීකරවීම අවිධිමත් පරිසර සම්පත් ලබාදීම මහෝපකාරී වනු ඇත. ළමා ලෝකයේ පරිසර චමත්කාරය දනවන හීන්සැරය - මඩොල්දූව - අපේ ගම - මහදැනමුත්තා වැනි දේශීය පොත පත හුරුකරවීමටද ආකල්ප වර්ධනය හේතුවෙන් වේ. බොහෝ බුද්ධිමත් දෙමව්පියන් දැනටමත් තම දරුවන්ගේ සංස්කෘතික ලෝකය සඳහා එවැනි කටයුතු වලට දරුවන් පොළඹවනු දැකීම සතුටට කරුණකි.ළමයාගේ ලෝකයෙ සැරසිය යුත්තේ කෑම බීම, ඇඳුම් පැළඳුම් හා අරුමෝසම් වලින් නොව වැඩිහිටියන් නැති දිනයක ඔවුනට මුහුණ පෑමට සිදුවන භෞතික හා පාරිසරික ගැටලුවලට මුහුණ දිය හැකි පන්නරයක් හා පෞරුෂයක් ගොඩ නැගීමෙනි. ප්‍රකට රාජ්‍ය තාන්ත්‍රිකයෙකු වූ හිටපු ඇමරිකන් ජනාධිපති ඒබ්‍රහම් ලින්කන්, තම දරුවන්ගේ ලෝකය සකස්කිරීමට එකී විදුහල්පතිතුමාගෙන් කළ ඉල්ලීම පිළිබඳ මෙහිදී අවධානය යොමු කිරීම වටී.

''මගේ පුතාට කියාදෙන්න හැම මනුෂ්‍යයකුම සත්‍යවාදී හෝ සර්ව සාධාරණ නොවන බව ඔහුට පොත්වල ඇති චමත්කාරය පෙන්වා දෙන්න අහසේ පියාසර කරන කුරුල්ලන් හිරු රැසින් පියාඹන මීමැස්සන් නිල්වන් කඳු බැවූමක පිපී වැනෙන වන මල් කියාපාන සදාතනික රහස ගැන ඔහුට නිවී සැනසිල්ලේ සිතන්නට ඉඩ හරින්න. ඔහුට මෘදු ලෙස සලකන්න. වානේ හොඳට තැනිය හැක්කේ ගින්නෙන් රත් වූ විට බවට ඔහුට පහද දෙන්න.''




